ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

60 | S | I, II

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2022 පෙබරවාරි**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 செப்டம்பர்**
Genaral Certificate of Education (Ord. Level) Examination, February 2022

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I, II**
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

වැදගත් : ❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 5කටපමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුලුව I කොටසින් ප්‍රශ්න 2ක් ද, II කොටසෙන් ප්‍රශ්න 2ක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**
❖ **පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.**

01. තාරුක, උසස් අධ්‍යාපනය නිම කිරීමෙන් පසු තම නිවස ආසන්නයේ පිහිටි ඇඳුම් අළෙවි කිරීමේ ව්‍යාපාරයක සේවයට බැඳුනි. වසර 2ක් පමණ සේවය කිරීමෙන් පසු ඔහුගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කළ තාරුක සේවයෙන් ඉවත් වී තමා ඉතිරි කරගෙන තිබූ මුදල් රු. 300,000ක් ද තමා සතු රු. 800,000ක් වටිනා මෝටර් රථය ද යොදවා බොරැල්ල නගරයෙන් කුලියට ගත් ගොඩනැගිල්ලක තාරුක ටෙක්ස්ටයිල් නමින් නිමි ඇඳුම් අළෙවි කිරීමේ ව්‍යාපාරයක් 2021.03.01 දින ආරම්භ කළේය. එදින ම රු. 50,000ක බැංකු ණයක් ලබා ගත් අතර ඉන් රු. 30,000ක් තැන්පත් කර බොරැල්ල ලංකා බැංකුවේ ජංගම ගිණුමක් විවෘත කරන ලදි. දක්ෂ සේවකයින් දෙදෙනෙකු හා දක්ෂ කළමණාකරුවෙකු සේවයට බඳවාගත් අතර ඇඳුම් ඇසිරීම සඳහා රු. 35,000ට අල්මාරි 2ක් මිලදී ගත්තේ ය.
මාර්තු මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදු විය.

| | |
|---|---|
| නිමි ඇඳුම් මිලට ගැනුම් | රු. 120,000 |
| සේවක වේතන | රු. 50,000 |
| ගොඩනැගිලි කුලී | රු. 25,000 |
| ගෙනඒමේ කුලී | රු. 4,000 |
| විදුලිය ගාස්තු | රු. 2,500 |
| විකුණුම් | රු. 250,000 |
| වෙනත් වියදම් | රු. 6,000 |
| ගැනිලි | රු. 10,000 |

01. i. තාරුක ටෙක්ස්ටයිල් ඉටුකරන මිනිස් අවශ්‍යතාව හා වුවමනාවක් දක්වන්න.
ii. නිෂ්පාදිත වල ස්වභාවය අනුව මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර වර්ගයට අයත් ද?
02. තාරුකගේ ව්‍යාපාරය සඳහා ඇති ශක්තීන් 2ක් දක්වන්න.
03. i මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයක් ද?
ii එම ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ දැකිය හැකි වාසි දෙකක් හා අවාසි දෙකක් ලියන්න.
04. i තාරුක ටෙක්ස්ටයිල් ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? හේතු දක්වන්න.
ii බැංකු ණය ලබා ගැනීම සඳහා ව්‍යාපාරය සපුරාලිය යුතු අවශ්‍යතා දෙකක් ලියන්න.
05. i ව්‍යාපාරයට ආදායම් උපයා දෙන අලෙවි මිශ්‍රයේ විචල්‍ය කුමක් ද?
ii. තම ව්‍යාපාරයේ අලෙවිය වැඩි කර ගැනීම සඳහා තාරුකට අනුගමනය කළ හැකි වඩාත් සුදුසු ප්‍රවර්ධන ක්‍රමයක් නම් කරන්න.
06. 2021.03.01 දිනට ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව දක්වන්න.
07. i මෙම ව්‍යාපාරය සේවකයන් දෙදෙනෙකු හා කළමණාකරුවකු බඳවා ගැනීමත් ඔවුන්ට තනතුරු හා වැඩ බෙදා දීමත් සිදු කිරීම කුමන කළමණාකරණ කාර්යකට අයත් වේ ද?
ii ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් වැඩි වීමට අදාල ගනුදෙනුවක් වටිනාකම් සහිතව ලියන්න.
08. i 2021.03.31 දිනට මුදල් පොතේ ශේෂය කොපමණද ?
ii මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කමක් හා ජංගම නොවන වගකීමක් ලියන්න.
09. මාර්තු මාසයේ මෙම ව්‍යාපාරයේ ලාභය කොපමණ ද?
10. 2021.03.31 දිනට හිමිකම් ගණනය කරන්න. (ලකුණු 20 යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්ණ **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

02. i a. අවශ්‍යතා යන්න හඳුන්වා මූලික මිනිස් අවශ්‍යතා නම් කරන්න.
b. නිෂ්පාදන සාධක නම් කරන්න.

ii. නාලක පාසල් අධ්‍යාපනය අවසන් කර තමා ඉගෙන ගත් පාසල ආසන්නයේ ම පාසල් ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ වෙළඳ සැලක් පවත්වාගෙන යයි. පාසලේ සිසුන් විශාල පිරිසක් දෛනිකව තම වෙළෙඳ සලට පැමිණීම ඔහුගේ ව්‍යාපාරය ඉතා ඉක්මනින් සාර්ථක වීමට හේතු විය. මෑතක දී ඔහුගේ වෙළෙඳ සැලට ආසන්නයේ ම තවත් වෙළෙඳ සැලක් ආරම්භ කරන ලදි. නාලකගේ ව්‍යාපාරයේ අවස්ථාවක් හා තර්ජනයක් ලියන්න.

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
a. ව්‍යාපාර තම නිෂ්පාදන වල අලෙවිය වැඩි කර ගැනීමට යොදා ගන්නා විවිධ උපක්‍රම අලෙවි මිශ්‍රය නම් වේ. ( )
b. භාණ්ඩ හා සේවා පිළිබඳව පාරිභෝගික ප්‍රතිචාර සොයා බැලීම හා අලෙවියෙන් පසු අවශ්‍ය සේවා සැපයීම අළෙවිකරණයට අයත් කාර්යයකි. ( )
c. තීරණ ගැනීමේ ස්වාධීනත්වයක් නොමැති වීම දෙපාර්තමේන්තු මුහුණ පාන ගැටළුවකි. ( )
d. සැළසුම් කළ පරිදි නිෂ්පාදන හා අලෙවි කටයුතු සිදු නොවී නම් ඊට හේතු සොයා බැලීම පාලනයට අයත් වේ. ( )

iv. a. ව්‍යාපාර සඳහා රජය විසින් නිතිරීති පැනවීමේ අරමුණු 2ක් සඳහන් කරන්න.
b. ව්‍යාපාර වල පොදුවේ දැකිය හැකි අරමුණු 2ක් ලියන්න.

(ලකුණු 08 යි)

03. i. a. ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 02ක් ලියන්න.
b. හවුල් ව්‍යාපාරයක දැකිය නොහැකි සංස්ථාපිත සමාගම්වල දැකිය හැකි ලක්ෂණ 02ක් ලියන්න.

ii. a. චෙක්පතකට සම්බන්ධ පාර්ශවයන් නම් කරන්න.
b. චෙක්පතක චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ ඇතුළත් කරුණු අනු පිළිවෙලින් සඳහන් කරන්න.

iii. අළෙවි මිශ්‍රයට අයත් විචල්‍යක් නම් කරන්න.

iv. පහත සඳහන් ප්‍රකාශ වලින් සත්‍ය ද අසත්‍ය යන්න දක්වන්න.
a. දෙපාර්තමේන්තුවක් උපයන ලාභයෙන් කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරයි. ( )
b. සාමාන්‍ය කොටස් සඳහා නිශ්චිත ලාභාංශයක් නොමැත. ( )
c. ඕනෑම අවස්ථාවක ඕනැම ස්ථානයක සිට වුවද බැංකුවට නොගොස් ව්‍යාපාරිකයෙකුට තම මුදල් පාලනය කළ හැකි වීම ජංගම දුරකථන බැංකුකරණයේ වාසියකි. ( )
d පුද්ගලයෙකුට හදිසි අනතුරකදී වන හානිය යථා තත්වයට පත්කරගැනීම සඳහා හානිපූරණ මූලධර්මය අනුව වන්දි ගෙවනු ලැබේ. ( )

(ලකුණු 08 යි)

04. i. විද්‍යුත් මුදල් යන්න හඳුන්වා වර්තමානයේ විද්‍යුත් මුදල් වර්ග ලෙස භාවිත කරන කාඩ්පත් වර්ග 2ක් නම් කරන්න.

ii. a. ප්‍රවාහනයේ මූලිකාංග නම් කරන්න.
b. දුම්රිය මාර්ග ප්‍රවාහනයේ වාසි 2ක් හා අවාසි 2ක් ලියන්න.

iii. a. ජීවිත රක්ෂණයක් ලබා ගැනීම වැදගත් වීමට හේතු 2ක් ලියන්න.
b. ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධක 2ක් නම් කරන්න.

iv. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
a. ව්‍යාපාරයකට වඩාත් ආකර්ශණීය ලෙස මෙන්ම ලාභදායිව තෘප්තිමත් කළ හැකි පාරිභෝගිකයන්ගෙන් සමන්විත වෙළෙඳපොළ කොටස ඉලක්ක වෙළෙඳ පොළ යි. ( )
b. පණිවුඩයක් ලැබුණ බවට හා තේරුම්ගත් බවට ලබන්නාගෙන් යවන්නා වෙත වාචිකව හෝ වාචික නොවන මාර්ගයකින් ලැබෙන පිළිතුර ප්‍රතිචාරය නම් වේ. ( )
c. සමාගමකින් මිලදී ගත් කොටස් වෙනත් අය සමග හුවමාරු කිරීමේ දී එම වෙළෙඳ පොල ගනුදෙනු මෙහෙයවනු ලබන්නේ කොටස් වෙළෙඳ පොලයි. ( )
d. භාණ්ඩාගාර බිල්පත් පූර්ණ රාජ්‍ය ආරක්ෂාවක් ඇති ආයෝජන මාර්ගයක් වේ. ( )

(ලකුණු 08 යි)

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්ණ **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

05. i. හිමිකම වෙනස් වීමට බලපාන සාධක 2ක් නම් කරන්න.

ii. මුදල් පොතෙන් ඉටුවන ද්විත්ව කාර්ය නම් කරන්න.

iii. පහත සඳහන් ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.

07/01 ප්‍රාග්ධනය යොදුවා රු. 100,000
07/03 අත්පිට විකුණුම් රු. 8,000
07/07 බැංකු ණයක් ගත්තා රු. 50,000
07/11 ලී බඩු මිලදී ගත්තා රු. 15,000
07/13 ගොඩනැගිලි කුලි ආදායම් ලැබුණා රු. 12,000
07/15 ණයට භාණ්ඩ මිලදී ගත්තා රු. 9,500

iv. සාගාරිකා ව්‍යාපාරය 2021.11.01 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරිව තිබූ මුදල් රු. 270 කි. නොවැම්බර් මාසයේ සුළු මුදල් ගනුදෙනු පහත පරිදි වේ. මාසික සුළු මුදල් අග්‍රිමය රු. 2,500 කි.

| | |
|---|---|
| 2021.11.01 | අග්‍රිමය ප්‍රතිපූරණය කළා. |
| 2021.11.03 | තැපල් ගාස්තු රු. 140 |
| 2021.11.07 | ගමන් වියදම් රු. 100 |
| 2021.11.08 | මුද්දර ලිපි කවර රු. 150 |
| 2021.11.09 | ගමන් වියදම් රු. 400 |
| 2021.11.12 | ලිපිද්‍රව්‍ය ගත්තා රු. 200 |
| 2021.11.15 | සුනිල්ට ගෙව්වා රු. 4,000 |
| 2021.11.17 | කම්කරු කුලි ගෙව්වා රු. 500 |
| 2021.11.20 | ලිපිද්‍රව්‍ය ගත්තා රු. 250 |

ඉහත තොරතුරු ඇසුරෙන් මෙම ව්‍යාපාරයේ සුළු මුදල් පොත පිළියෙල කර අග්‍රිමය ප්‍රතිපූරණය කරන්න.

(ලකුණු 12 යි)

06. i. සෂාන්ගේ ව්‍යාපාරය විසින් 2021.12.31 දින පිළියෙළ කරන ලද ශේෂ පිරික්සුම සම නොවූ හෙයින් එහි වෙනස වූ රු 3,100 අවිනිශ්චිත ගිණුමට බැර කරන ලදි. පසුව එම වෙනසට හේතු ලෙස පහත සඳහන් කරුණු සොයා ගන්නා ලදි.

- ❖ මෝටර් රථ අලුත් වැඩියා වියදම රු. 4,500 මෝටර් රථ ගිණුමට හර කර ඇත.
- ❖ රක්ෂණ ගාස්තු ගිණුමේ රු. 2,100 ශේෂය ශේෂ පිරික්සුමට ගෙන ගොස් නැත.
- ❖ දුන් වට්ටම් රු. 3,000 ලැබූ වට්ටම් ලැබූ වට්ටම් ලෙස සටහන් කර ඇත.
- ❖ රු. 2,000 ක ගැනිලි මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.
- ❖ වැටුප් ලෙස ගෙවූ රු. 13,200 වැටුප් ගිණුමේ දෙවරක් සටහන් වී ඇත.

අ. ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අදාළ ජනල් සටහන් පෙන්වන්න.
ආ. අවිනිශ්චිත ගිණුම පිළියෙළ කරන්න.

ii. 2021.06.30 දිනට සපුමලීගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 12,500ක් විය. එදිනට ලද බැංකු ප්‍රකාශයේ ශේෂය ඊට වෙනස් වූයෙන් එම වෙනසට හේතු ලෙස පහත කරුණු සොයා ගන්නා ලදි.

- ❖ තැන්පත් කළ උපලබ්ධි නොවූ චෙක්පත් රු. 7,500
- ❖ බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුව අය කළ බැංකු ගාස්තු රු. 1,500යි.
- ❖ නිකුත් කළ මුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 9,000
- ❖ බැංකුවට සෘජුවම ලැබුණු ලාභාංශ රු. 5,000
- ❖ ස්ථාවර නියෝග ගෙවීම් - ණය වාරිකය රු. 4,500 යි.

**අවශ්‍ය වන්නේ,**

i. සංශෝධිත බැංකු ගිණුම
ii. 2021.06.30 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙළ කරන්න.

(ලකුණු 12 යි)

07. i. එක්සත් සුහ සාධන සමිතියේ සාමාජික සංඛ්‍යාව 200කි. එක් අයකුගෙන් සාමාජික ගාස්තුව මසකට රු. 50 ක් වන අතර සාමාජිකයන් 20 දෙනෙකු මෙම වසරට සාමාජික මුදල් ගෙවා නොමැත.

අ. ආදායම් ප්‍රකාශයට ඇතුළත් කළ යුතු සාමාජික මුදල කීයද ?

ආ. මූල්‍ය තත්ව ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල කීයද?

ඉ. වෙළෙඳ ව්‍යාපාරයක මුදල් පොතට සමානව ලාභ අරමුණු කර නොගත් සංවිධානයක පිළියල කරනුයේ කිනම් ගිණුම ද? එය අයත් වන ගිණුම්කරණ මූලධර්මය කුමක් ද?

ii. සදෙව්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 100,000 |
| 2021.01.01 තොගය | 12,000 | |
| ගැණුම් | 42,000 | |
| ණයගැතියෝ | 12,000 | |
| ගෙනඒමේ කුලි | 2,500 | |
| විකුණුම් | | 65,000 |
| ණයහිමියෝ | | 8,500 |
| ඉඩම් ගොඩනැගිලි (පිරිවැය) | 50,000 | |
| මෝටර් රථ (පිරිවැය) | 70,000 | |
| ප්‍රචාරණ වියදම් | 4,000 | |
| පරිපාලන වේතන | 15,000 | |
| 10% බැංකු ණය | | 50,000 |
| ගැනිලි | 3,000 | |
| බැංකු ණය පොලී | 1,500 | |
| විකුණුම් කොමිස් | 500 | |
| ලද වට්ටම් | | 3,500 |
| බැංකු ගාස්තු | 1,000 | |
| දුන් වට්ටම් | 1,500 | |
| විදුලිය | 2,000 | |
| රක්‍ෂණය | 400 | |
| මුදල් | 9,600 | |
| | 227,000 | 227,000 |

**අමතර තොරතුරු**

- 2021.12.31 ඉතිරි තොගය රු. 9,000කි.
- මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්‍ෂය කළ යුතුය.
- ණයගැතියන්ගෙන් රු. 1,000ක් බොල් ණය ලෙස කපා හැරිය යුතුය.

**අවශ්‍ය වන්නේ,**

a. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශණය

b. 2021.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

(ලකුණු 12 යි)